# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශේෂ

අංක 1954/43 - 2016 පෙබරවාරි මස 19 වැනි සිකුරාදා - 2016.02.19

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# I වැනි කොටස: (I) වැනි ඡෙදය - සාමාන්‍ය

## රජයේ නිවේදන

එල්.ඩී.බී. 21/78 (XII)

**1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනත**

27 (1) වැනි වගන්තිය යටතේ වූ නියමය

1978 අංක 16 දරන විශ්වවිද්‍යාල පනතේ 27(1) වැනි වගන්තිය මගින් මා වෙත පැවරී ඇති බලතල ප්‍රකාර, උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය ලක්ෂ්මන් කිරිඇල්ල වන මා විසින්, විශ්වවිද්‍යාල ප්‍රතිපාදන කොමිෂන් සභාවේ නිර්දේශය සහිතව, එකී පනතේ 21 වැනි වගන්තිය යටතේ සාදනු ලැබ 1999 අගෝස්තු 17 දින අංක 1093/8 දරන *අති විශේෂ ගැසට් පත්‍රයේ* පළකරනු ලැබූ ශ්‍රී ලංකාවේ වයඹ විශ්වවිද්‍යාලයට අදාළ වූ නියමයේ උපලේඛනය පහත පරිදි මෙයින් සංශෝධනය කරනු ලැබේ :-

1 1 වන තීරයේ දැක්වෙන ''කෘෂිකර්ම හා වැවිලි කර්මාන්ත පීඨය'' යන අයිතමයට අනුරූප වන්නා වූ උපලේඛනයේ 2 වන තීරයේ දැක්වෙන ''ජෛව තාක්ෂණවේදී අධ්‍යයන අංශය'' යන අයිතමයට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් ;

''ජෛවපද්ධති තාක්ෂණ ඉංජිනේරු අධ්‍යයන අංශය''

2 1 වන තීරයේ දැක්වෙන ''පශු සම්පත්, ධීවර සහ පෝෂණ පීඨය'' යන අයිතමයට සහ ඊට අනුරූප වන්නා වූ උපලේඛනයේ 2 වන තීරයේ දැක්වෙන අයිතමවලට ඉක්බිතිව ම පහත දැක්වෙන අයිතමය එකතු කිරීමෙන් ;

| ''*1 වන තීරය* | *2 වන තීරය* |
|---|---|
| වෛද්‍ය පීඨය | කාය ව්‍යවච්ඡේද අධ්‍යයන අංශය ; |
| | භෞතවේදී අධ්‍යයන අංශය ; |
| | ජීව රසායන අධ්‍යයන අංශය ; |
| | ශල්‍ය වෛද්‍ය අධ්‍යයන අංශය ; |
| | ප්‍රසව හා නාරිවේද අධ්‍යයන අංශය ; |
| | ළමා වෛද්‍ය අධ්‍යයන අංශය ; |
| | මානසික රෝග අධ්‍යයන අංශය ; |
| | ප්‍රජා වෛද්‍ය සහ පවුල් වෛද්‍ය අධ්‍යයන අංශය ; |
| | කායික වෛද්‍ය අධ්‍යයන අංශය ; |
| | ව්‍යාධිවේදී අධ්‍යයන අංශය ; |
| | ඖෂධවේදී අධ්‍යයන අංශය ; |
| | ක්ෂුද්‍ර ජීවී විද්‍යා අධ්‍යයන අංශය ; |
| | අධිකරණ වෛද්‍ය අධ්‍යයන අංශය ; |
| | පරපෝෂවේදී අධ්‍යයන අංශය ; |
| | වෛද්‍ය අධ්‍යාපන අධ්‍යයන අංශය.'' |

ලක්ෂ්මන් කිරිඇල්ල,
උසස් අධ්‍යාපන හා මහාමාර්ග අමාත්‍ය.

2016 පෙබරවාරි මස 16 වැනි දින,
කොළඹ දී ය.

03 - 183